

# උපාය මාර්ගික සැලැස්ම
# 2020 - 2024



ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව -දකුණු පළාත

## විධායක සාරාංශය.

දකුණු පළාත තුළ රජයේ ඉඩම් කළමනාකරණයේ ප්‍රධානතම ආයතනය ලෙස දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සිය දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා **2020 – 2024** පස් අවුරුදු කාල පරිච්ඡේදය තුළ නිශ්චිත ,සැලසුම් සහගත සහ ඉලක්කගත වැඩපිළිවෙලක් තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත උපාය මාර්ගික සැලැස්ම මෙමගින් ඉදිරිපත් කර ඇත.

එක්සත් ජාතීන්ගේ සහශ්‍ර සංවර්ධන ඉලක්ක සහ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති මාලාව පදනම් කර ගනිමින් හා එම අරමුණුවලට සමපාත වෙමින් මෙම උපාය මාර්ගික සැලැස්ම සකස් කර ඇත. දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රාජකාරි වපසරිය ආවරණය වන පරිදි රජයේ ඉඩම් මැන සැලසුම් කිරීම,ඉඩම් බැහැර කිරීම,ඉඩම් ආදායම් රැස් කිරීම,ඉඩම් සංරක්ෂණය,මානව සම්පත් කළමනාකරණය හා ආයතන සංවර්ධනය යන මූලික ක්ෂේත්‍රයන් යටතේ මෙම සැලැස්ම කේන්ද්‍රගත වී ඇත. මෙමගින් මෙතෙක් වාර්ෂික ව ඉලක්ක සකස් කර ගනිමින් එම ඉලක්කයන් සපුරා ගැනිමට උත්සාහ දැරීම වෙනුවට ඉදිරි පස් අවුරුද්ද සඳහා ම එක් සැලැස්මක් හා ඉලක්කයන් හඳුනා ගෙන ඇති බැවින් ඉදිරි වසර පහ තුළ දෙපාර්තමේන්තුවේ දිශානතිය මෙමගින් විදහා දැක් වේ.

දෙපාර්තමේන්තුවේ ඉහළම තනතුරේ සිට දූරාවලියේ පහළ ම තනතුර දක්වා නිශ්චිත වගකීම් හඳුනාගෙන ඇති අතර ආයතනයේ භෞතික මෙන් ම මානව සම්පත පූර්ණ උපයෝජනයට ලක්කර ගැනීම සහ ආයතනය සතු ශක්තීන් සහ අවස්ථා ඵලදායීව යොදා ගැනීම ද මෙමගින් සිදු කරනු ලබයි. එනිසා ආයතනය මගින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන්හි ගුණාත්මක සංවර්ධනයක් අත්කර ගැනිමට අපේක්ෂා කරන අතර ආයතනයක් ලෙස මෙතෙක් මුහුණ දුන් ආයතනික දුර්වලතාවයන් හා තර්ජනයන් මගහරවා ගැනීම ද අපේක්ෂා කරයි.

# පරිච්ඡේදය 01

# ආයතනය පිළිබඳ හැඳින්වීම, පසුබිම,බලතල සහ ගනුදෙනුකරුවන්

## 01. දෙපාර්තමේන්තුව පිළිබඳ හැඳින්වීම : -

### 1.1 දකුණු පළාතේ ඉඩම් ව්‍යාප්තිය , සමාජ ආර්ථික තත්ත්වය.

මානව ශිෂ්ටාචාර පරිණාමය සමඟ මිනිස් අවශ්‍යතා සංකීර්ණ වීම තුළින් ස්වභාවික සම්පත් වැඩි වශයෙන් ඒ සඳහා යොදා ගැනීමට මිනිසා පුරුදු විය. මුල් කාලීන ව ඉඩම් යනු ඉතා සුලභ සම්පතක් වූ අතර ජනගහන වර්ධනයත් සමඟ ඉඩම් භාවිතය තරමක් සංකීර්ණ තත්ත්වයකට පත්විය. ශ්‍රී ලංකා ඉතිහාසය සලකා බැලීමේදී ද ඉඩම් පරිපාලනය කලින් කලට ක්‍රමානුකූලව වෙනස් වී ඇති බව නිරීක්ෂණය වේ. මුල් කාලීන ව තම තමන්ගේ පෞද්ගලික අරමුණු සහ ක්‍රමවේද ඔස්සේ පුරාතන ශ්‍රී ලාංකිකයන් විසින් ඉඩම් භාවිතය සිදුකළ අතර රාජාණ්ඩු ක්‍රමයන් බිහිවීමත් සමඟ විධිමත් ස්වභාවයක් ගෙන ඇත.

සිංහල රජ දවස “රජු” යන්නට භූපති හෙවත් භූපාල යන නාමයන් භාවිතා වූ අතර මෙහි අර්ථය වූයේ භූමියේ ආරක්ෂකයා යන්නයි.එසේ ම සියලු ක්ෂේත්‍රයන්ගේ අධිපති ලෙස ද රජු නම් වූ අතර තම දේශයේ පවත්නා සියලු ඉඩම්වල පරම අයිතිකරු වූයේ ද ඔහුය. ඒ අනුව රජු විසින් තම රාජධානි ප්‍රාදේශිය මට්ටමින් කොටස්වලට බෙදා ප්‍රාදේශීය පාලකයන් හරහා ඒ ඒ ප්‍රදේශවල පවත්නා ඉඩම් පරිපාලනය සිදු කරගෙන ඇත.මෙම ඇතැම් ප්‍රාදේශීය පාලකයන් ගමික, පරුමක වැනි නම්වලින් හඳුන්වා ඇත. එකල භාවිතා කරන ලද ඉඩම් විවිධ පදනම් භාවිතා කරමින් කොටස්වලට බෙදා ඇති අතර ප්‍රධාන ලෙස ම වගා කරන ලද භෝගය, හිමිකාරීත්වය හා අස්වැන්න බෙදීම අනුව වර්ග කර ඇත.

මීට අමතරව රජතුමා විසින් මහා සංඝයාට හෝ වෙනත් අයට ප්‍රදානය කරන ලද ගම් “භෝග ගාම” ලෙස ද සිද්ධස්ථාන සඳහාම වෙන් කරන ලද ගම් “නින්ද ගම්”,”විහාර ගම්” හෝ “දේවාල ගම්” හැඳින්විය. එම කාලයන්වල දී ද රජයේ ඉඩම් පරිහරණය වෙනුවෙන් බදු මුදල් අයකිරීම් සිදුකර ඇත.එසේ ම රාජ සන්තක ඉඩම් අන්සතු කිරීමේ ක්‍රමවේදයන් ද එකල ක්‍රියාත්මක වී ඇත. මෙම ක්‍රමවේදයන් කලින් කලට වෙනස් වී ඇති අතර ප්‍රධාන ලෙස ම ලබා දෙනු ලබන ඉඩම් සීමා පෙන්වා කණු හෙවත් සීමා පහන් සිටුවා ආඥා කෙටූ ටැම් ලිපි මඟින් ඉඩම් ලබා දී ඇත. පසුව තඹ පත්‍ර නිකුත් කිරීම ද තවත් දියුණු වීමත් සමඟ අත්සන සහ මුද්‍රාව සහිත සන්නස් නිකුත් කිරීම ද සිදු වී ඇත.

මෙලෙස ඉඩම් පරිපාලන ක්‍රමවේදය රාජධානියෙන් රාජධානියට ද ප්‍රදේශයෙන් ප්‍රදේශයට ද විවිධ වී ඇති නමුත් ඉහත පරිදි පොදුවේ හඳුනාගත හැකි ලක්ෂණයන් පැවතී ඇත. ක්‍රි.ව.1505 සිට යුරෝපා ජාතීන් ශ්‍රී ලංකාව යටත් විජිතයක් ලෙස පාලනය කිරීමට ගත් කාලයේදී ශ්‍රී ලංකාව තුළ එවකට පැවති ඉඩම් නීතිය ඔවුන්ගේ අවශ්‍යතා ද සම්පූර්ණ වන පරිදි විවිධ සංශෝධනයන් කිරීමට කටයුතු කර ඇත. විශේෂයෙන්ම ස්වදේශිකයන්ගෙන් ඉඩම් අත්පත් කර ගැනීම හා බදු අයකිරීම යන කාර්යයන්වල දී මහජනතාවගේ දැඩි විරෝධතා එල්ල වීම හේතුවෙන් වරින් වර සිදුකරන ලද නීති පැනවීම් හා සංශෝධනයන් ඔස්සේ නව නීති සම්පාදනය වී ඇත.

## 1.2 යුරෝපා ජාතීන් යටතේ ශ්‍රී ලංකාවේ ඉඩම් පරිපාලනය.

යුරෝපා ජාතීන් ආසියාතික රටවල් ආක්‍රමණයේදී ප්‍රධාන අරමුණක් වූයේ එම රටවල්වල පවත්නා ස්වභාවික සම්පත් තුළින් ඔවුන්ගේ රටවල්වලට ආදායම රැස්කර ගැනීමයි. මෙහි දී ශ්‍රී ලංකාව වැනි දේශගුණික ලක්ෂණ සහිත ආසියාතික රටවල්වල වැවිලි බෝග වගාව ව්‍යාප්ත කිරීමට ඔවුන් විසින් පියවර ලන්නා ලදි. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා ස්වදේශිකයන්ට අයත්ව තිබූ ඉඩම් ඔවුන්ගේ පරිහරණයට නතුකර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නැඟුණි. පෘතුග්‍රීසි හා ලන්දේසි පාලන කාලවල මෙම කටයුත්ත නිසි ලෙස ඉටුකර ගැනීමට නොහැකි වුව ද වැඩි කාලයක් ශ්‍රී ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් විවිධ අණපනත් හඳුන්වාදීම මඟින් විශාල ලෙස දේශීය භූමි ප්‍රදේශ ඔවුන්ගේ අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් අත්පත් කර ගන්නා ලදි.මෙහි දී පහත විස්තර වන පරිදි කාලයෙන් කාලයට විවිධ අරමුණු ඔස්සේ නීති සම්පාදනය සිදුකරන ලදි.

***<u>1840 අංක 12 දරණ රජයේ ඉඩම් (බලෙන් අල්ලා ගැනීමේ) ආඥා පනත - State Land (Encroachment) Ordinance No 12 of 1840</u>***

මෙම පනත මගින් සියලු ම වනාන්තර ඉඩම්, මුඩු බිම්, වගා නොකළ ඉඩම් සහ පදිංචියක් නොදරන සියලු ඉඩම් රජයේ ඉඩම් බවට පූර්ව නිගමනය කරන ලදි. මෙවැනි ඉඩමක් සම්බන්ධව අයිතිය කියාපාන තැනැත්තෙකු ඉහත පූර්ව නිගමනය බිඳ හෙලිය යුතු ය. ඊට අදාළ ව නිශ්චිත මායිම් සහ ප්‍රමාණ සහිත ව ප්‍රදානය කර ඇති සන්නසක් හෝ දීමනා පත්‍රයන් ඉදිරිපත් කළ යුතුය.

***<u>1897 අංක 1 දරණ මුඩු බිම් ආඥා පනත - Waste Land Ordinance No 1 of 1897</u>***

වනාන්තර, හේන් වගා කළ බිම්, මුඩු බිම්, සහ පදිංචියක් නොදරන ඉඩම් සම්බන්ධව පෞද්ගලික හිමිකම් ඇති ඉඩම් කඩිනමින් විසඳා තීරණය කිරීම මෙම පනතේ මූලික අරමුණ වේ. විශේෂයෙන් 1840 අංක 12 දරණ පනත මගින් රජයේ ඉඩම් බලධාරීන් යම් ඉඩමක් රජයේ ඉඩමක් බවට පූර්ව නිගමනය කරන අවස්ථාවක දී එය බිඳ හෙළීමට පෞද්ගලික හිමිකම් පාන්තිකයන්ට ඇති ඉඩකඩ තවදුරටත් සීමා කරන ලද අතර එහිදී පැන නැඟුණු ගැටළු විසඳීම සඳහා මෙම පනත හඳුන්වා දෙන ලදි.

මෙලෙස දේශීය ඉඩම් රජය වෙත පවරාගෙන විශාල වශයෙන් වැවිලි බෝග වගාවන් මෙරට තුළ ව්‍යාප්ත කෙරුණු අතර දේශීය කෘෂිකර්මාන්තය වෙනුවෙන් අවධානය යොමුකිරීම අඩුවීම හේතුවෙන් කෘෂිකාර්මික බෝග වගා ව්‍යාප්තිය සීඝ්‍ර ලෙස පහත වැටිණි. වාරි කර්මාන්තය බිඳවැටීම හේතුවෙන් පවත්නා බෝගයන් ද විනාශ වීම සිදු වූ අතර ආහාර ඌණතාවයන් නිසා ජනතාව තුළ කැළඹිලි සහගත භාවයක් ද ඉංග්‍රීසි ආණ්ඩුවට විරුද්ධව විරෝධතා ප්‍රකාශ කිරීමට ද ස්වදේශිකයන් පෙළඹුණි.

ක්‍රි.ව.1919 පමණ වන විට බ්‍රිතාන්‍ය ආණ්ඩුව ලෝක යුධ ගැටුම් වලට මුහුණ දීම හේතුවෙන් මෙරට තුළ ද විශාල ආහාර අර්බුදයක් නිර්මාණය විය. ඒ වන විට දේශීය කෘෂිකර්මාන්තයද බිඳවැටීම හේතුවෙන් තත්ත්වය තවත් උග්‍ර අතට හැරිණ. මේ තත්ත්වය මත නැවත කෘෂිකර්මාන්තය නඟා

සිටුවීම සඳහා රජයේ ඉඩම් මහජනතාව වෙත බෙදා දීමටත් වාරිමාර්ග ක්‍රම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති වෙත නැඹුරු වීමටත් එකල රජයට සිදුවිය.

1927 දී මේ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම පිණිස ඉඩම් කොමිසම පිහිටුවන ලද අතර එහි වාර්තාව 1929 දී ඉදිරිපත් කරන ලදි. එමගින් ඉදිරිපත් කළ යෝජනා 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණයන් පසු 1931 දී පිහිට වූ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය ධුරයට පත් වූ ඩී.එස්.සේනානායක මැතිතුමා විසින් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව 1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනත ප්‍රකාශ කිරීමට රජය විසින් තීරණ ගන්නා ලදි.

ඉන් අනතුරුව කාලීන අවශ්‍යතා පදනම් කර ගනිමින් ඉඩම් විෂයට අදාළ විවිධ අණපනත් ශ්‍රී ලංකා ඉඩම් නීතියට එකතු විය. වර්තමානයේ රජයේ ඉඩම් රාජකාරි ඉටු කිරීමේ දී උපයෝගී කරගනු ලබන්නේ පහත සඳහන් අණපනත්ය.

- **1935 අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥා පනත.**
- **1947 අංක 08 දරණ රජයේ ඉඩම් ආඥා පනත.**
- **1979 අංක 43 දරණ ඉඩම් ප්‍රදාන(විශේෂ විධිවිධාන) පනත.**
- **1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත.**
- **1979 අංක 07 දරණ රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත.**

මෙම සියලු පනත් මධ්‍ය රජයේ ඉඩම් අමාත්‍යාංශය හා ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව හරහා දිවයින පුරා ඒකාකාරී ව බලාත්මක වන ලදි.

### 1.3 පළාත් සභා වෙත ඉඩම් බලතල හිමිවීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ පළාත් සභා පිහිටුවන ලදි. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය 1987 නොවැම්බර් මස 14 දින බලාත්මක වූ අතර එහි 09 වන උපලේඛනයේ 01 වන ලැයිස්තුව මගින් පලාත් සභා වලට අයත් වන විෂයන්ද 02 වන ලැයිස්තුව මගින් මධ්‍යම රජය වෙතට පැවරෙන සංවෘත විෂයන්ද 03 වන ලැයිස්තුව මත සමගාමී ලැයිස්තුව යටතේ පලාත් සභාව මධ්‍යම රජය ඒකාබද්ධ ව කටයුතු කළ විෂයන් පිළිබඳව ද සඳහන් කර ඇත. මෙහිදී ඉඩම් විෂයය අයත් වන්නේ පළාත් සභා ලැයිස්තුව යටතේ පළාත් සභා විෂයක් ලෙස වේ. එම තත්ත්වය තුළ පළාත් සභා විෂයන් සම්බන්ධ ව නීතියක් පැනවීමට පාර්ලිමේන්තුව ක්‍රියා කිරීමේ දී එම පනත පිළිබඳව එකඟතාවය පළාත් සභා වෙතින් ලබා ගැනීමට ජනාධිපතිවරයා කටයුතු කළ යුතු ය. එය සියලු පළාත් සභාවල එකඟතාව ලැබීම මත සාමාන්‍ය පරිදි පාර්ලිමේන්තුවට සම්මත කළ හැකිය. නමුත් යම් කෙටුම්පතකට පළාත් සභාව විරුද්ධ වන අවස්ථාවක පාර්ලිමේන්තුවේ 2/3 වැඩි ඡන්දයෙන් එය සම්මත විය යුතුය.

1989 අංක 12 දරණ පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2(1) වගන්තිය යටතේ පළාත් ඉඩම් කොමසාරිස්වරයාට එම පළාත තුළ රජයේ ඉඩම් සම්බන්ධ කටයුතු කිරීමේ බලතල හිමිව ඇත. ඊට

අමතරව ඒ සෑම පළාත් ඉඩම් කොමසාරිස්වරයෙක් ම රජයේ අතිරේක ඉඩම් කොමසාරිස්වරයෙක් වශයෙන්ද පත්කර ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර ඇත. ඒ අනුව ඉඩම් කොමසාරිස්වරයා සතු බලතල අදාළ පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ බලය පළාත් ඉඩම් කොමසාරිස් වෙත පැවරී ඇත. ඒ අනුව දකුණු පළාත තුළ රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමට දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව 1990 වර්ෂයේ දී ආරම්භ කරන ලදි.

ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල රජයේ ඉඩම්වල පරිපාලන හා කළමනාකරණ කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ. දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලය ගාල්ල නගරයෙහි පිහිටා ඇති අතර , ගාල්ල,මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල 3ක් ද පවතී

## 1.4 දකුණු පළාතේ ඉඩම් ව්‍යාප්තිය.

වර්ග කිලෝ මීටර 65610 ක මුළු භූමි ප්‍රමාණයකින් යුක්ත ශ්‍රී ලංකාව ආසියානු මහාද්වීපය තුළ ඉන්දියන් සාගරයෙන් වටවූ කුඩා දූපතක් වන අතර මෙම දිවයිනට අයත් සමස්ත භූමි ප්‍රමාණයෙන් 66% ක් වන ගහණයකින් යුක්ත වන අතර ඉතිරි ප්‍රදේශ මානව හා ආර්ථික සංවර්ධන ක්‍රියාවලීන් සඳහා ප්‍රයෝජනයට ගත හැකි මට්ටමක පවතී. ශ්‍රී ලංකාව පරිපාලනමය අවශ්‍යතා මත පළාත් 09 කට වෙන්කර ඇති අතර දකුණු පළාත බස්නාහිර පළාත, ඌව පළාත, සබරගමුව පළාත හා නැගෙනහිර පළාත් වලට ගොඩබිමින් මායිම් වී ඇති අතර දකුණු දෙසින් සම්පූර්ණයෙන්ම ඉන්දියන් සාගරයෙන් මායිම් වී ඇත. මෙම පළාත ගාල්ල, මාතර, හම්බන්තොට යන ප්‍රධාන දිස්ත්‍රික්ක 3කින් සමන්විත වන අතර සම්පූර්ණ ජනගහණය 2018 වර්ෂයේ දී ආසන්න වශයෙන් මිලියන 2.6ක් පමණ වේ.

බහු ආගමික හා සංස්කෘතික වටපිටාවක් සහිත මෙම පළාත තුළ වැඩි ප්‍රමාණයක් සිංහල ජනගහනය ජීවත් වේ. මීට අමතරව මුස්ලිම් සහ දෙමළ මෙන් ම අනෙකුත් සුළු ජාතීන් ද විවිධ ප්‍රදේශ මූලික කරගෙන ජීවත් වනු ලැබේ. ලෝක උරුම සහ ජාතික උරුම රැසකට නිජ භූමිය සපයන මෙම පළාත තුළ පවත්නා විශේෂ වැදගත්කම් සහිත ස්ථාන කිහිපයක් නම් සිංහරාජ වනාන්තරය, කන්නෙලිය වන රක්ෂිතය, ගාලු කොටු පවුර හා යාල අභයභූමිය ආදිය දැක්විය හැකිය. මෙම පළාතේ කෘෂිකාර්මික වගාවන් පෝෂණය කරමින් සහ අනෙකුත් මානව අවශ්‍යතා සංතෘප්ත කරමින් පළාත තුළ සොබාලංකාරය වර්ධනය කරමින් ගලා යන ගංඟා කිහිපයක්ම පවතින අතර ගිංගඟ, නිල්වලා ගඟ හා වළවේ ගඟ ඒ අතරින් ප්‍රධාන වේ.

මෙම පළාත තුළ පිහිටි ඉඩම් කලින් වැඩි බිම් ප්‍රමාණයක් කෘෂිකර්මාන්තය සඳහා යොදවා ඇති අතර තවමත් කෘෂිකර්මාන්තය මෙම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වේ. මීට අමතරව ඉන්දියන් සාගරයට මායිම් වී පිහිටීම මත ධීවර කර්මාන්තය ද මුහුදු සීමාව තුළ ව්‍යාප්ත වී ඇත. පුළුල් වෙරළ තීරයකට උරුමකම් කීමත් විවිධ භූ විශමතා ලක්ෂණ සහිත ප්‍රදේශයන් පැවතීමත්

නිසා දේශීය සහ විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය දිනා ගෙන ඇති මෙම ප්‍රදේශයේ සංචාරක ව්‍යාපාරය මෙම ප්‍රදේශවල ප්‍රධාන ආර්ථික ක්‍රමෝපායක් වේ.

### 1.5. දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ආරම්භය හා විකාශනය.

1987 වර්ෂයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පළාත් සභා ක්‍රමය පිහිටුවීමේන් පසුව 1989 අංක 12 දරණ පළාත් සභා අනුශංගික විශේෂ විධිවිධාන පනතේ 2(1) වගන්තිය යටතේ පළාත් ඉඩම් කොමසාරිස්වරයාට එම පළාත තුළ රජයේ ඉඩම් සම්බන්ධව කටයුතු කිරීමේ බලතල හිමිකර දී ඇත.ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව 1990 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර මුල් ම කාර්යාලය ගාල්ල කොටුවෙහි ඊකෝව්ස් ගොඩනැගිල්ලෙහි ස්ථාපනය කර ඇතර ප්‍රථම දකුණු පළාත් ඉඩම් කොමසාරිස්වරයා වූයේ චන්ද්‍රා රණසිංහ මහතාය.

ඉන් අනතුරුව ඉහළ ඩික්සන් පාර වලව්වත්ත ගොනැගිල්ල,ගාල්ල නගර සභා සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලෙහි,ගාල්ල නගර සභා ගොඩනැගිල්ලහි ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කර අතර වර්තමාන ස්ථානය වන නො.211,වක්වැල්ල පාර,ගාල්ල යන ස්ථානයේ 2017 වර්ෂයේ සිට පවත්වාගෙන යනු ලබයි.ආරම්භයේ දී දකුණු පළාත සඳහා ප්‍රධාන කාර්යාලයක් පමණක් පැවති අතර පසුව පිළිවලින් මාතර,ගාල්ල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක සඳහා උප කාර්යාල වශයෙන් සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල පිහිටුවා ඇත.

## 02. <u>රාජකාරි සඳහා ඍජු ව සම්බන්ධ වන ගනුදෙනුකරුවන්</u>

1. මහජන නියෝජිතයින්
2. රජයේ ඉඩම්වල අනවසරයෙන් භුක්ති විඳින පුද්ගලයින්
3. රජයේ ඉඩම්වල බලපත්‍ර හා දීමනාපත්‍රලාභීන්
4. රජයේ ඉඩම්වල වාර්ෂික බලපත්‍රලාභීන් හා දීර්ඝ කාලීන බදු හිමිකරුවන්
5. රජයේ ඉඩම්වල විහාරස්ථාන පිහිටි විහාරාධිපති හිමිවරුන් හා අන්‍ය ආගමික ස්ථානවල ප්‍රධානීන්
6. රජයේ ඉඩම්වල පිහිටි අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානීන්
7. පළාත් පාලන ආයතන ප්‍රධානීන්
8. ප්‍රාදේශීය ලේකම්වරුන් හා ප්‍රාදේශීය කාර්යාලවල ඉඩම් අංශ නිළධාරීන්
9. ඉඩම් රාජකාරී සම්බන්ධ සියලු ම රාජ්‍ය නිලධාරීන්
10. රජයේ ඉඩම් ඉල්ලුම් කරන මහජනතාව
11. රජයේසේවකයන්/කර්මාන්තකරුවන්/ව්‍යවසායකයින්/ව්‍යාපාරිකයින්.
12. දේශීය විදේශීය ආයෝජකයින්
13. නීති ක්ෂේත්‍ර නිලධාරීන්
14. රාජ්‍ය නොවන සංවිධාන හා ස්වේච්ඡා සංවිධාන.

**04.** **රාජකාරී කටයුතුවල දී සම්බන්ධ වන රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ආයතන**

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යනු පළාත් සභා පරිපාලන ක්‍රමවේදය තුළ ක්‍රියාත්මක වන එක් ආයතනයක් වන බැවින් මෙම දෙපාර්තමේන්තුවට අදාල සියලූ ආයතනික කටයුතු පළාත් සභා ධූරාවලියට අයත් පහත ආයතන හරහා සිදුවේ.

1. පළාත් සභා ඉඩම් අමාත්‍යාංශය
2. ප්‍රධාන ලේකම් කාර්යාලය
3. දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
4. ආණ්ඩුකාර කාර්යාලය

ඉහත ආයතනික කටයුතුවලට අමතරව මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇති ප්‍රධානතම රාජකාරිය වනුයේ පළාත තුළ පවත්නා රජයේ ඉඩම්වල කළමනාකාරීත්වය සිදුකිරීමයි. ශ්‍රී ලංකාව තුළ ඉඩම් පරිපාලන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේ දී මෙම කාර්යය සඳහා සහසම්බන්ධ වන ආයතන රාශියක් පවතී. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් රජයේ ඉඩම්වල භාරකාරීත්වය පැවරී ඇති බැවින් බොහෝ ඉඩම් රාජකාරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ආරම්භ වී ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා පුළුල් පරාසයක් තුළ පැතිරී ඇත. ඒ අනුව රජයේ ඉඩම් සම්බන්ධ රාජකාරිවල දී ඒ සඳහා ඍජුව ම මැදිහත් වන ආයතන පහත පරිදි හඳුනා ගත හැක.

5. ප්‍රාදේශීය ලේකම් කාර්යාල
6. දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
7. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
8. මධ්‍යම රජයේ ඉඩම් අමාත්‍යාංශය
9. ජනාධිපති ලේකම් කාර්යාලය

රජයේ ඉඩමක් වෙනත් පාර්ශවයකට බැහැර කිරීමක දී ඒ සඳහා ජනාධිපතිතුමාගේ අනුමැතිය ලැබීමට අදාල ප්‍රධාන ම ක්‍රියාවලීන් සිදුවන්නේ ඉහත ආයතන හරහා නිර්දේශිත වාර්තා ඉදිරිපත් කිරීම මඟිනි.

මෙම ප්‍රධාන සහසම්බන්ධිත ආයතනවලට අමතරව ඉඩම් රාජකාරි සඳහා ඉඩම් මැනීම, නිර්දේශ වාර්තා ලබාදීම හා අදාල තාක්ෂණික උපදෙස් ලබාදෙන ආයතන රාශියක් පහත පරිදි හඳුනා ගත හැක.

10. දිස්ත්‍රික් ලේකම් කාර්යාල(ගාල්ල,මාතර,හම්බන්තොට)
11. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
12. ඉඩම් පරිහරණ හා සැළසුම් දෙපාර්තමේන්තුව
13. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
14. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
15. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

16. පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා/නගර සභා/මහනගර සභාව)
17. මධ්‍යම පරිසර අධිකාරිය
18. නාගරික සංවර්ධන අධිකාරිය (U.D.A)
19. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (N B RO)
20. භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය
21. රාජ්‍ය දැව සංස්ථාව
22. රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
23. මාර්ග සංවර්ධන අධිකාරිය
24. ආයෝජන මණ්ඩලය, වාණිජ මණ්ඩලය, කර්මාන්ත සංවර්ධන අධිකාරිය
25. දකුණු පළාත් නීති අංශය, නීතිපති දෙපාර්තමේන්තුව, අධිකරණය
26. ජනාධිපති ලේකම් කාර්යාලය
27. මහා භාරකාර දෙපාර්තමේන්තුව
28. බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව
29. ජාතික විගණන කාර්යාලය
30. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
31. ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
32. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
33. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
34. මහවැලි සංවර්ධන අධිකාරිය
35. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
36. කෘෂි කර්ම දෙපාර්තමේන්තුව
37. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
38. තක්සේරු දෙපාර්තමේන්තුව
39. ශ්‍රී ලංකා පොලීසිය

# පරිච්ඡේදය 02

# උපායමාර්ගික දිශානතීන්.

## 02. උපාය මාර්ගික දිශානතීන්.

### 2.1 දෙපාර්තමේන්තුවේ දැක්ම:-

**"රජයේ ඉඩම් නිසි කළමණාකරණය තුලින් දිවයිනේ විශිෂ්ඨතම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව බවට පත්වීම."**

### 2.2 දෙපාර්තමේන්තුවේ මෙහෙවර:-

**" තිරසර සංවර්ධනය උදෙසා රජයේ ඉඩම් ආරක්ෂා කිරීම, සංවර්ධනය කිරීම, නිරවුල් කිරීම, බැහැර කිරීම හා ආදායම් රැස් කිරීම තුලින් දකුණේ ජනතාවගේ ජීවන තත්ත්වය හා ආර්ථිකය නංවාලීමට දායක වීම."**

### 2.3 වටිනාකම්(Values):-

ආයතනයක පැවැත්ම තීරණය වනුයේ එම ආයතනය විසින් සමාජයට ලබාදෙනු ලබන සේවාවන් වල තිබෙන ගුනාත්මකභාවය හා වටිනාකම මතය. විශේෂයෙන්ම සේවා සපයන ආයතනයක් වූ කලී එම සේවාවන් වල තිබෙන ගුණාත්මකභාවය පිළිබඳව වඩාත් සැලකිළිමත් විය යුතුය. මෙම කාර්යයේදී සේවා ලාභියා මෙන්ම සේවා දායකයාගේ පාර්ශවයේ ක්‍රියාකාරකම් ද ඉතා වැදගත් වෙයි. ඒ අනුව සේවා දායකයා නියෝජනය කරනු ලබන ආයතනයේ සේවක මණ්ඩලය මෙම සේවා සැපයීමේ කාර්යයේ එක් ප්‍රධාන පුරුකක් ලෙස සැලකිය හැකිය. මෙහිදී ඉහළ නිලධාරියාගේ සිට පහළම නිලධාරියා දක්වා අගයනු ලබන හා පුරුදු කරනු ලබන ප්‍රතිපත්ති වේ නම් එම සංකල්පයන් එම ආයතනයේ වටිනාකම් ලෙස හඳුනා ගත හැක.

ඉතා වටිනා හා සීමිත සම්පතක් වන ඉඩම් සම්පත සමඟ ගණුදෙනු කරන දකුනු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට ද මෙම කාර්යයන් සාර්ථකව ඉටුකර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පුරුදු පුහුණු කළ යුතු යැයි පොදුවේ සම්මත කරගන්නා ලද වටිනාකම් කිහිපයක් පහත පරිදි හඳුනාගත හැකිය

#### I. අවංකභාවය හා අපක්ෂපාතීත්වය

ඕනෑම රාජ්‍ය නිලධාරියෙකු තම සේවයට හා වගකීමට අවංකව කටයුතු කළ යුතුය. තමා විසින් ලබා ගන්නා වැටුපට සාධාරණයක් ඉටුවන පරිදි තම උපරිම හැකියාව සේවයට එකතු කරමින් රාජකාරි ඉටුකළ යුතු අතර එහිදී තමා වෙත පැමිණෙන සියළු සේවා ලාභීන්ට පොදු නීතිරීති පද්ධතිය මත පිහිටා සේවාවන් ලබාදිය යුතුය.

### II. විනිවිදභාවය

ඉතා සීමිත සම්පතක් පරිපාලකයා වන බැවින් මෙම සම්පත බෙදාදීම හා කළමණාකරණය කිරීම ඉතා පැහැදිලි ක්‍රියාකාරකම් හා ප්‍රතිපත්තීන් මත පිහිටා සිදුකළ යුතුය. කිසියම් රාජකාරීමය ක්‍රියාවලියක් පිළිබඳව ප්‍රශ්න කරනු ලබන ඕනෑම අවස්ථාවකදී ඒ සඳහා පිළිතුරු දීමේ හැකියාවක් හා එම ලබාදෙනු ලබන පිළිතුරු වල තර්කානුකූල හා පිළිගත හැකි භාවයකින් යුක්ත විය යුතුය. ඒ සඳහා පැහැදිලි හා විනිවිදභාවයකින් යුත් සම්මතයන් පිහිටුවා ගත යුතුය.

### III. සමානාත්මතාවය හා සාධාරණත්වය

තමන් ඉදිරියට පැමිණෙන සියළු සේවා ලාභීන් එක හා සමානව සළකා ඔවුන්ගේ අවශ්‍යතා සාධාරණ කාලයක් තුළ කඩිනමින් විසඳා දීමට කටයුතු කළ යුතුය. ජනතාවගේ තරාතිරම් පිළිබඳව නොසලකා පැමිණෙන සියළු පිරිස් පොදුවේ ඉඩම් ගැටළු වලට මුහුණ දී ඇති පුද්ගලයන් ලෙස සැලකිය යුතුය.

### IV. වගකීම හා වගවීම

තමාට පැවරෙන කාර්යයන් නිසිපරිදි ඉටු කිරීමට බැඳී සිටින බව සියළු නිලධාරීන් විසින් අවධාරණය කළ යුතුය. එහිදී තමා විසින් ඉටුකරනු ලබන කාර්යයන්ට අදාල විශය පථය පිළිබඳ අවධානය කර ඒ පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් වෙයි.

### V. කණ්ඩායම් හැඟීම

සේවා සපයනු ලබන ආයතනයක කාර්යයන් තනි පුද්ගලයෙකු විසින් සපයන්නක් නොවන අතර කණ්ඩායමක් විසින් එකතු වී සිදුකරනු ලබන ක්‍රියාකාරකමක් ද වෙයි. ඒ අනුව තම කොටස මනා ලෙස ඉටුකිරීමටත් කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයන්ගේ වගකීමක් හා යුතුකමක් වේ.

### VI. විනයගරුක බව හා ආචාරශීලීත්වය

රාජ්‍ය සේවයේ ගරුත්වය ආරක්ෂා වන පරිදි කටයුතු කිරීමට සියළු නිලධාරීන් බැඳී සිටින අතර තමා හමුවට පැමිණෙන සේවා දායකයින්ගේ අභිමානයට හානි නොවන පරිදි ඔවුන් වෙත සුහදශීලී සේවයක් ලබාදීමට සියළු නිලධාරීන් විසින් කටයුතු කළ යුතුය.

### VII. කාර්යක්ෂමතාවය හා සඵලදායීතාවය

තමා විසින් ඉටු කරනු ලබන කාර්යයන් පිළිබඳව මනා අවබෝධයක් තිබේනම් එම කාර්යයන් ඉතා කඩිනමින් හා සාර්ථක ලෙස ඉටුකරදීමට හැකියාව ලැබෙනු ඇත. මෙහිදී තම කාර්යයන් කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා වන නිර්මාණශීලී හැකියාව ලබා ගැනීමද ඉතා වැදගත් වෙයි. එනම් ජනතාවගේ ඉඩම් ගැටළු විසඳීම තුලින් රජයේ ඉඩම් සම්පත මනා ලෙස කළමණාකරණය කිරීම සිදුකිරීමයි.

**2.4 .ප්‍රධාන කාර්යය දර්ශක.**

| ප්‍රධාන කාර්යයන් | ලගකාකර ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් | | | | |
|---|---|---|---|---|---|
| දර්ශක | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| 1.දීමනාපත්‍ර සකස් කිරීම. | 3000 | 3000 | 2000 | 1000 | 1000 |
| 2.බලපත්‍ර සකස් කිරීම. | 2000 | 1000 | 1000 | 500 | 500 |
| 3.දීර්ඝ කාලින බදු නිර්දේශ ඉදිරිපත් කිරීම. | 600 | 400 | 200 | 200 | 100 |
| 4.දීර්ඝකාලීන බදුකර සකස් කිරීම්. | 150 | 120 | 100 | 80 | 80 |
| 5..වාර්ෂික බදුකර සකස් කිරීම. | 250 | 250 | 200 | 200 | 100 |
| 6.ඉඩම් ආදායම් රැස් කිරීම ඉහළ දැමීම. | මි.17 | මි.9 | මි.9 | මි.7.5 | මි.7.5 |

## 2.5 <u>දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්:-</u>

දකුණු පළාත තුළ පවත්නා රජයේ ඉඩම් සම්පත සංවර්ධනය හා කළමණාකරණය පිළිබඳ වගකිව යුතු ප්‍රධාන බලයලත් ආයතනය වනුයේ දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවයි.ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව වෙත ව්‍යවස්ථාපිතවම පැවරුනු පුළුල් පරාසයක් තුළ විහිදුණු ඉඩම් රාජකාරි සමූහයක් ඒකරාශී වී ඇත.මෙම සියළු කාර්යයන් එම එක් එක් කාර්යයන් වලින් ඉටුකර ගැනීමට අපේක්ෂිත පරමාර්ථයන් මත ප්‍රධාන කාර්යයන් 5 ක් යටතේ විශ්ලේෂණය කල හැක.

**2.4.1 ඉඩම් මැන සැලසුම් කිරීම.**

**2.4.2 රජයේ ඉඩම් බැහැර කිරීම.**

**2.4.3 ඉඩම් ආදායම් රැස් කිරීම.**

**2.4.4 ඉඩම් සංරක්ෂණය.**

**2.4.5 මානව සම්පත් කළමණාකරණය හා ආයතන සංවර්ධනය**

# පරිච්ඡේදය 03

# ආයතනයේ අභ්‍යන්තර පරිසරය

# සංවිධාන ව්‍යුහය.

## දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව.

### ආයතනික ධූරාවලිය - ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව



## කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තරය.

## දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව.

| අනු අංකය | තනතුරු කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව. |
|---|---|---|---|
| 01 | පළාත් ඉඩම් කොමසාරිස් | 01 | 01 |
| 02 | සහකාර ඉඩම් කොමසාරිස් | 06 | 05 |
| 03 | ගණකාධිකාරී | 01 | 01 |
| 04 | මිනින්දෝරු | 03 | 01 |
| 05 | පරිපාලන නිළධාරී | 01 | 01 |
| 06 | ජ්‍යෙෂ්ඨ ජනපද නිළධාරී | 07 | 03 |
| 07 | සංවර්ධන නිළධාරී | 114 | 107 |
| 08 | ජනපද නිළධාරී | 60 | 59 |
| 09 | කළමණාකරණ සහකාර | 13 | 11 |
| 10 | රියදුරු | 07 | 06 |
| 11 | මැනුම් සහායක | 09 | 06 |
| 12 | කාර්යාල කාර්ය සහායක | 05 | 05 |
| 13 | මුරකරු | 01 | 00 |
| එකතුව | | 228 | 207 |

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව දකුණු පළාතේ අධ්‍යාපන,ඉඩම් හා ඉඩම් සංවර්ධන ,මහාමාර්ග ,ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවක් වන අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා වනුයේ දකුණු පළාත් ඉඩම් කොමසාරිස් වරයාය.ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළවන පන්තියේ තනතුරක් වන අතර ඔහු යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර ඉඩම් කොමසාරිස්වරු තිදෙනෙක් ගාල්ල,මාතර,හම්බන්තොට යන දිස්ත්‍රික් අධීක්ෂණය සඳහා පත්කර ඇති අතර ගාල්ල,මාතර,හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුන සඳහා තාක්ෂණ සේවයේ සහකාර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තු තනතුරු තුනක් ද ස්ථාපනය කර ඇති අතර එම දිස්ත්‍රික් තුන සඳහා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල තුනක් ද පිහිටුවා අවශ්‍ය කාර්යය මණ්ඩලය සහ සම්පත් ද එම කාර්යාල සඳහා ලබා දී ඇත.

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව ශ්‍රී ලංකා පරිපාලන සේවය,ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය, ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය,ශ්‍රී ලංකා තාක්ෂණ සේවය,සංවර්ධන නිළධාරී සේවය,කළමණාකරණ නිළධාරී සේවය,රියදුරු සේවය,මැනුම් සහායක සේවය,කාර්යාල කාර්යය සේවය යන සේවා ගණයන්ට අයත් නිලධාරීන් සේවය කරනු ලබයි.

දකුණු පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 47 ක් පිහිටා ඇති අතර එම කාර්යාල වල ඉඩම් රාජකාරි ප්‍රාදේශීය මට්ටමින් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ඉඩම් නිළධාරීන්,ජනපද නිළධාරීන් සහ සංවර්ධන නිළධාරී සේවයේ සංවර්ධන නිළධාරීන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රාජකාරි ප්‍රමාණය සැලකිල්ලට ගෙන අනුයුක්ත කර ඇත.මෙම නිළධාරීන්ගේ රාජකාරි අදාළ දිස්ත්‍රික්කය භාර සහකාර ඉඩම් කොමසාරිස්වරයා විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලැබෙන මැනුම් ඉල්ලීම්වලට අදාළ මැනුම් කටයුතු ඒ ඒ දිස්ත්‍රික්කය භාරව ක්‍රියා කරනු ලබන රජයේ මිනින්දෝරු වරයා විසින් මැනුම් කර අදාළ වාර්තා සහ පිඹුරු නිකුත් කිරීමට කටයුතු කරනු ලබයි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අනුයුක්ත කර ඇති ඉඩම් නිළධාරීන් සහ ජනපද නිළධාරීන් විසින් රජයේ ව්‍යවස්ථාපිත ඉඩම් රාජකාරි කටයුතු ඉටු කරන අතර රජයේ ඉඩම් ආදායම් එක්රැස් කිරීම සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සංවර්ධන නිළධාරීන් විසින් සිදුකරනු ලබයි.

# පරිච්ඡේදය 04

# බාහිර පරිසරය විශ්ලේෂණය

## 04. ආයතනික බාහිර පරිසරය විශ්ලේෂණය (PESTEL)

### 4.1 දේශපාලනික පාරිසරික බලපෑම

ඉඩම් විශය යනු බලයට පත්වන සෑම ආණ්ඩුවකම ප්‍රමුඛතා පරාසයක් වන බැවින් මෙම විශයට සමගාමීව සිදුකරනු ලබන කාර්යයන් සඳහා ඔවුන්ගේ මැදිහත් වීම බොහෝ අවස්ථාවන්හිදී සිදුවන්නකි.මෙම අවධානය යොමුකිරිම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ රාජකාරි සිදුකිරීමේදී වාසිදායක සහ තර්ජනාත්මක බලපෑම් වලට මුහුණදීමට දෙපාර්තමේන්තුගත නිලධාරීන්ට සිදුවේ.

<u>හිතකර</u> <u>බලපෑම්</u>:-

- ප්‍රමුඛතා පරාසයක් වීම මත ඉඩම් අයිතිය නියමානුකූල කිරීම සඳහා විවිධ ව්‍යාපෘති සකස් කිරීම වෙනුවෙන් දේශපාලනික අංශයන්ගේ මැදිහත් වීම.
- ඉඩම් රාජකාරි කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා නිලධාරීන් යොමුකිරීම වෙනුවෙන් දිරිදීමනා ලබාදීම වැනි පෙලඹවීමේ සාධක ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය සහයෝගය ලබාදීම.

<u>අහිතකර</u> <u>බලපෑම්</u>:-

- ඉඩම් බෑහැර කිරීමේදී හා ඉඩම් ගැටළු විසඳීමේදී දේශපාලනඥයන්ගේ අවිධිමත් මැදිහත් වීම.
- රජයේ ඉඩම් කළමණාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා දේශපාලන නායකත්වය මැදිහත් නොවීම.
- 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පළාත් සභා වෙත ලබාදී ඇති ඉඩම් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ණ බලතල ලබා නොදීම.
- ඇතැම් දේශපාලනඥයන් විසින් අනවසර රජයේ ඉඩම් අල්ලා ගැනීම හා අවිධිමත් ඉඩම් භාවිතය සඳහා ජනතාව පෙළඹවීම.
- දේශපාලන අවශ්‍යතා මත දේශීය හා විදේශීය මහා පරිමාණ ව්‍යාපෘති සඳහා විශාල ප්‍රමාණයෙන් සැලැස්මකින් තොරව රජයේ ඉඩම් බෑහැර කිරීම.
- ඉඩම් ආදායම් රැස්කිරිමේ කාර්යයේදී අනවශ්‍ය ප්‍රමාණයේ සහන ලබාදීමට බලපෑම් කිරීම තුළින් රජයට අයවිය යුතු බදු ආදායම රැස්කර ගැනීමට නොහැකි වීම.

### 4.2 ආර්ථිකමය පාරිසරික බලපෑම

රටක පවත්නා ආර්ථික තත්වය එම රටේ සංවර්ධන කාර්යයන් සඳහා අතිශයින්ම වැදගත් වේ.ඉඩම් කළමණාකරණ විෂය ආර්ථික තත්වය වෙනස් කිරීමට බලපාන සාධකයක් මෙන්ම රටෙහි පවත්නා ආර්ථික තත්වය ඉඩම් වල වටිනාකම් උච්චාවචනයන් සඳහා ද බලපානු ලබයි.ඒ අනුව ඉඩම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා වර්තමානයේ පවතින ආර්ථික රටාවන් යහපත් හා අයහපත් ආකාරයන්ගෙන් ලබපානු ලබයි.

හිතකර බලපෑම්:-

- ඉඩම් වටිනාකම් ඉහල යෑම මත රජයේ ආදායමට රැස්කර ගත හැකි බදු මුදල් ප්‍රමාණය ඉහළ යෑම.
- මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩම් ලබාදීම තුලින් ඉඩම් කළමණාකරණ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට අවස්ථාවක් ලැබීම.

අහිතකර බලපෑම්:-

- වැවිලි ආර්ථිකය බිඳවැටීම මත බදුකරුවන් විසින් බදු ගෙවීම පැහැර හැරීම.
- ඉඩමේ ආර්ථික වටිනාකම ඉහළ යෑම තුලින් රජයේ ඉඩම් ආරක්ෂා කර ගැනීමට වැඩි පරිශ්‍රමයක් දැරීමට සිදුවීම.
- ලබාදෙනු ලබන ඉඩම් ප්‍රමාණය සීමිත වීමත් ඉඩම් සඳහා ගෙවිය යුතු බදු කුලී ප්‍රමාණය ඉහළ යෑමත් නිසා නීත්‍යානුකූල නොවන ක්‍රමවේදයන් ඔස්සේ ඉඩම් හුවමාරු කිරීමේ ප්‍රවණතාවයන් ඇතිවීම.
- ඉඩම් වල ආර්ථිකමය වටිනාකම ඉහළ යාම මත වැවිලි බෝග සඳහා වෙන්කර ඇති විශාල ප්‍රමාණයේ ඉඩම් නේවාසික කටයුතු වෙනුවෙන් කුඩා කොටස් වලට කැබලි කිරීමට සිදුවීම මත ආදායම් අහිමි වීමේ අවධානම.

### 4.3 සමාජීය පාරිසරික බලපෑම

ඕනෑම ආයතනයක ප්‍රමුඛතම කාර්යය වනුයේ සමාජීය අවශ්‍යතා තෘප්තිමත් කිරීමයි. සමාජය තුලින්ම සම්පත් උකහා ගෙන සමාජය වෙතටම සේවය කරන බැවින් මෙම සියළු ආයතන විසින් සමාජීය වටපිටාවේ වෙනස් වීම් පිළිබඳව අවධානය යොමුකල යුතුය. ඉඩම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය ද වනුයේ රටේ පවත්නා ඉඩම් අවශ්‍යතාව රජයේ ඉඩම් තුලින් කළමණාකරණය කිරීමයි. එහිදී ශ්‍රී ලාංකික සමාජය තුළ තිබෙන සමාජ, ප්‍රජා හා සංස්කෘතික තත්ත්වයන් මත පදනම්ව ඉඩම් බෙදාදීම සහ ඉඩම් රාජකාරි වලට අදාල නීති සැකසීමේ කාර්යය සිදුකල යුතුය.ඒ අනුව ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රාජකාරිමය වපසරිය වෙත සමාජීය පද්ධතීන් වල බලපෑම පහත පරිදි විශ්ලේෂණය කල හැක.

හිතකර බලපෑම:-

- වත්මන් සමාජය තුළ අධ්‍යාපන මට්ටම් ඉහළ යාම මත ඉඩම් නීතිය පිලිබඳ දැනුමක් සහිත පුද්ගලයන් සිටීම නිසා එය ඉඩම් පරිපාලනමය කටයුතු සඳහා යහපත් ලෙස බලපෑම.

අහිතකර බලපෑම:-

- සීඝ්‍ර ජනගහන වර්ධනයත් සමඟ අවිධිමත් ජනාවාසකරණය නිසා ඉඩම් කළමණාකරණයට බාධා ඇතිවීම.

- පුද්ගලයන් තුළ ඉඩම් අයිතිය දූ දරුවන් වෙත බැහැර කිරීමට ඇති අකමැත්ත සහ එසේ බැහැර කිරීමේදී පවත්නා නීති වලට අනුගත නොවීම මත ඉඩම් ආරවුල් ප්‍රමාණය ඉහල යාම.
- ගතානුගතික ආකල්ප හේතුවෙන් තට්ටු නිවාස වැනි ක්‍රමවේදයන්ට ප්‍රවේශ වීමට පුද්ගලයන් තුළ පවත්නා අකමැත්ත නිසා ඉඩම් අවශ්‍යතාව නිසි පරිදි සම්පූර්ණ කිරීමට නොහැකි වීම.

## 4.4 තාක්ෂණික පාරිසරික බලපෑම

නිරන්තරයෙන් නව්‍යකරණය වන තාක්ෂණික ක්‍රමවේදයන් හේතුවෙන් වර්තමානයේ පවත්නා බොහෝ ආයතනික ක්‍රියාවලින් ඉතා කාර්යක්ෂමව සිදුකර ගැනීමට හැකියාව ලැබී ඇත. විශේෂයෙන් තොරතුරු තාක්ෂණයේ සීග්‍ර දියුණුව භූගෝලීය බාධකයන් බිඳ හෙලීමට සමත් වී ඇත. බොහෝ පෞද්ගලික ආයතන මෙම ක්‍රමවේදයන්ට පූර්ණ වශයෙන්ම අනුගත වීමට උත්සාහ කළ ද රාජ්‍ය ආයතන වල මෙම ප්‍රවණතාව තවමත් ප්‍රාථමික මට්ටමේ පවතී. කෙසේ නමුත් මෙම තාක්ෂණික විපර්යාසයන් වල බලපෑම සියළු මානව ක්‍රියාකාරකම් උදෙසා බලපානු ලබයි. ඉඩම් රාජකාරි උදෙසා මෙම තාක්ෂණික වෙනස්වීම් වල බලපෑම පහත පරිදි දැක්විය හැක.

<u>හිතකර බලපෑම:-</u>

- දියුණු වන තොරතුරු තාක්ෂණික ක්‍රමවේද යොදාගෙන ජාලගතකරණය හා මාර්ගගත ක්‍රම ඔස්සේ ඉඩම් රාජකාරි සිදුකිරීමට පද්ධති නිර්මාණය කිරීමට හැකිවීම.(දීමනා පත්‍ර සැකසීමේ මාර්ගගත පද්ධතිය වන E-Slims)
- නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කරගෙන ඉඩම් රාජකාරි ඉක්මනින් සිදු කිරීමට හැකිවීම.

උදා:-රජයේ ඉඩම් මැනුම් කිරීම ප්‍රමාද වීම ඉඩම් රාජකාරි ඉටුකිරීම ප්‍රමාද වීමට ප්‍රධාන හේතුවක් වී ඇත.නමුත් GPS වැනි නවීන සහ සරල තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම මඟින් ඇතැම් මැනුම් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට හැකිවීම මත ප්‍රමාද වන ඉඩම් රාජකාරි කඩිනමින් ඉටුකිරීමට හැකිවීම.

- තොරතුරු සන්නිවේදන පද්ධති උපයෝගී කර ගනිමින් ජනතාව දැනුවත් කිරීම පහසු වීම.(දෙපාර්තමේන්තුගත වෙබ් අඩවිය landsp.lk)

<u>අහිතකර බලපෑම:-</u>

- තොරතුරු පද්ධති භාවිතයේදී ඇතුළත් කරනු ලබන තොරතුරු වල ආරක්ෂාව අඩු වුවහොත් වැරදි තොරතුරු සංසරණය වීමට හැකියාවක් පැවතීම.
- ඇතැම් තොරතුරු පද්ධති වල සංකීර්ණත්වය හේතුවෙන් ඒවා භාවිතය සඳහා නිලධාරීන්ගේ පසුගාමී බව.
- මාර්ගගත ක්‍රම ඔස්සේ කටයුතු කිරීමේදී එම පද්ධතීන්වල හදිසි බිඳවැටීම් සිදු වුවහොත් සම්පූර්ණ පද්ධතියම අඩපන වීම හා තොරතුරු නැතිවීමේ අවධානම.

## 4.5 පාරිසරික බලපෑම.

බොහෝ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණදී ඇති ප්‍රධානම ගැටළුවක් වී ඇත්තේ ස්වභාවික පරිසර හානියක් සිදුවීම මත එය ජනතාවට අහිතකර ලෙස බලපෑමයි. මේ හේතුවෙන් ආර්ථික සංවර්ධනය සහ පාරිසරික සංරක්ෂණය එක්ව කතා කලයුතු මාතෘකා දෙකක් බවට පත්ව ඇත. ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යනු තම රාජකාරි ව්‍යුහය තුළ පරිසර සංරක්ෂණය ප්‍රධාන කොටගත් ආයතනයකි.ඒ අනුව පාරිසරිකමය වශයෙන් සිදුවන සියළු වෙනස්වීම් ඉඩම් සංවර්ධන හා කළමණාකරන ක්‍රියාවලියට දැඩිසේ බලපෑම් එල්ල කරයි. මෙම පාරිසරික වෙනස්වීම් හිතකර හා අහිතකර යන අංශ දෙකෙන්ම ඉඩම් රාජකාරි සඳහා බලපානු ලැබේ.

<u>හිතකර බලපෑම්:-</u>

- පරිසර සංරක්ෂණය උදෙසා රජයේ අවධානයයොමුවීම මත පාරිසරික සංරක්ෂණය සමඟ ඉඩම් කළමනාකරණය කිරීම සඳහා වන ව්‍යාපෘති වෙනුවෙන් මුල්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හැකිවීම. මෙතුලින් පළාත තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා පවතින ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාව වර්ධනය කරගත හැකිය.

<u>අහිතකර බලපෑම්:-</u>

- සීග්‍රයෙන් අඩුවන වන ගහණය හේතුවෙන් පාංශු ඛාදනය ඉහළ යාම නිසා රජයේ ඉඩම් වල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වැඩි අවධානයක් හා වැඩි පිරිවැයක් දැරීමට සිදුවීම.
- බෙදා දී ඇති රජයේ ඉඩම් ආශ්‍රිතව පවත්නා වනාන්තර සහ රක්ෂිත ප්‍රදේශ වලට අනවසර ඇතුළුවීම් නිසා රක්ෂිත ප්‍රදේශ විනාශ වී යාමේ අවධානම අවම කිරීම සඳහා විශේෂ අවධානමක් යොමු කිරීමට සිදුවීම.
- පාංශු ඛාදනය හේතුවෙන් වගා කටයුතු සඳහා ලබාදී ඇති කෘෂිකාර්මික ඉඩම් වලින් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වීම

## 4.6 නෛතික පාරිසරික බලපෑම

මානව ශිෂ්ටාචාරයේ පරිණාමණයත් සමඟ සමාජ සාධාරණත්වය ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ අංශ ඔස්සේ නීති පද්ධතීන් නිර්මාණය වී ඇත. රටක හෝ ජන කොට්ඨාශයන්ට අදාලව සකසා ඇති නීති රීති වලට අනුගත වීමේ බැඳියාවක් සියළු පුද්ගලයන් හා ආයතන සතුව පවතී. මෙම නීතිරීති බොහෝසෙයින්ම යහපත් ආකාරයට බලපාන නමුත් නීති රීති වල යල්පැනගිය ස්වභාවය සහ අනම්‍යශීලී භාවය හේතුවෙන් ඇතැම් අවස්ථා වලදී අහිතකර බලපෑම් ද එල්ල වීම ගැටළුවක් වේ. මෙම දෙපාර්තමේන්තුව වෙත ද රටේ පවත්නා නෛතික තත්ත්වය හිතකර හා අහිතකර ලෙස බලපාන අවස්ථා පවතී.

හිතකර බලපෑම:-

- ඉඩම් ක්ෂේත්‍රය සඳහාම අනන්‍ය වූ නීති පද්ධතියක් පැවතීම මත ඉඩම් රාජකාරි සිදුකිරීම පහසු වීම.

අහිතකර බලපෑම:-

- ඉඩම් නීතිය වර්තමාන ආර්ථික,සාමාජීය හා පාරිසරික අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි යාවත්කාලීන නොවීම මත සංකීර්ණ ගැටළු මතුව තිබීම.
- වරින් වර බලයට පැමිණෙන දේශපාලන පක්ෂ වල කෙටිකාලීන අරමුණු උදෙසා පවත්නා නීතීන් ක්ෂණික තීරණ මත වෙනස් කිරීම හේතුවෙන් ඉඩම් රාජකාරි ඉටුකිරීමේ ක්‍රියාවලිය සංකීර්ණ වීම.
- ඉඩම් රාජකාරි ඉටුකිරීමේදී සමගාමීව කටයුතු කලයුතු සහසම්බන්ධිත ආයතන වල පවත්නා නීති රීති වල නොගැලපීම හේතුවෙන් ඉඩම් රාජකාරි සඳහා ගතවන කාලය දීර්ඝ වීම.

උදා:-වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වැනි ආයතන තමන්ට ආවේනික වූ නීති රීති මත කටයුතු කිරීම හා ඔවුන්ගේ ප්‍රමුඛතා පරාසයන් විවිධ වීම මත මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් රාජකාරි සඳහා අවශ්‍ය නිර්දේශයන් සහ සහායන් ලබා ගැනීම ප්‍රමාද වීම.

# පරිච්ඡේදය 05

# පසුගිය තෙවසරක කාර්යය සාධන සමාලෝචනය.

## 5.1පසුගිය තෙවසරේ කාර්ය සාධන සමාලෝචනය.

| ඉටුකරන ලද රාජකාරිය | වර්ෂය | | |
| --- | --- | --- | --- |
| විස්තරය | **2017** | **2018** | **2019** |
| 1.1.දීමනාපත්‍ර සකස් කිරීම. | 600 | 750 | 1812 |
| 1.2. බලපත්‍ර නිකුත් කිරීම | 3330 | 3952 | 4442 |
| 1.3. දීමනාපත්‍රවල පසු උරුමය නම් කිරීම. | 1852 | 2000 | 2281 |
| 1.4. බලපත්‍ර ඉඩම්වල පසු උරුමය නම් කිරීම. | 1562 | 1700 | 2179 |
| 2.1. ඉඩම් කච්චේරි මගින් හඳුනාගෙන ඇති ර.ඉ.ආ.පනත යටතේ දීර්ඝ කාලීන බදුකර සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. | 95 | 140 | 291 |
| 2.2. රජයේ දෙපාර්තමේන්තු සඳහා ඉඩම් පැවරීම. | 48 | 50 | 61 |
| 2.3. නේවාසික කටයුතු සඳහා නිදහස් දීමනාපත්‍ර නිකුත් කිරීම. | 15 | 25 | 19 |
| 2.4. ප්‍රාරම්භක බදුකර/විහාරස්ථාන සඳහා නිදහස් දීමනාපත්‍ර සකස් කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ලේඛන යොමු කිරීම. | 12 | 16 | 21 |
| 2.5. පදිංචිය සඳහා (LC 75) වාර්ෂික බදුකර නිකුත් කිරීම . | 52 | 75 | 113 |
| 2.6. එළදා බදු බලපත්‍ර නිකුත් කිරීම. | 12 | 18 | 29 |
| 2.7. සුනාමි අවතැන් වූ ජනතාව සඳහා බෙදා දුන් ඉඩම් සඳහා දීමනාපත්‍ර සැකසීම. | 198 | 210 | 243 |
| 3.ඉඩම් ආදායම් අය කිරීම් | 78,034,762.92 | 93,052,665.85 | 81,525,032.21 |

# පරිච්ඡේදය 06

# ශදුඅත විශ්ලේෂණය

## 06. ආයතනික අභ්‍යන්තර හා බාහිර පරිසරය විශ්ලේෂණය කිරීම.

දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යනු මහජනතාවගේ ඉඩම් හා සම්බන්ධිත කටයුතු ඉටුකිරීම සඳහා ව්‍යවස්ථාපිත බලතල සහිත පළාත් සභා ව්‍යුහයේ එක් ආයතනයකි. මෙම කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීමට නම් දෙපාර්තමේන්තුව සතු ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීමත් මුහුණදීමට සිදුවන තර්ජන විශ්ලේෂණය කිරීම හා බාහිර පරිසරය තුලින් ජනිත කරවන අවස්ථා හඳුනාගෙන ඊට අදාලව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතුය.ඒ අනුව පහත පරිදි “ශදූඅත විශ්ලේෂණය” මගින් දෙපාර්තමේන්තුවේ කාර්යයන් වල සාර්ථක අසාර්ථක භාවයට බලපෑම් කරන සාධක හඳුනාගෙන ඇත.

### 6.1 SWOT -ශදූඅත විශ්ලේෂණය

<u>ශක්තීන් (S)</u>

1. විවිධ ක්ෂේත්‍රයන්හි ඉහළ අධ්‍යාපන සුදුසුකම් හා අත්දැකීම් ලබා ඇති නිලධාරීන් පිරිසක් සේවයේ නියුක්ත වීම.
2. ප්‍රධාන කාර්යාලය හා සම්බන්ධිත දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාප්ත වී ඇති සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල පැවතීම.
3. ඉඩම් විෂය කේෂත්‍රයටම අනන්‍ය වූ නීති පද්ධතියක් පැවතීම හා එතුළින් බලගැන්වූ අධිකාරී බලය.

<u>දුර්වලතා (W)</u>

1. පළාත තුළ පවත්නා රජයේ ඉඩම් ප්‍රමාණය හා පිහිටීම හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් හා විධිමත් දත්ත පද්ධතියක් නොමැති වීම.
2. ඉටුකල යුතු කාර්යයන් පිළිබඳ නිශ්චිත සංඛ්‍යා ලේඛන නොමැති වීම නිසා අධීක්ෂණය අපහසු වීම.
3. නිළධාරීන් සඳහා වාර්ෂිකව ඉටුවිය යුතු රාජකාරි පිළිබඳ ඉලක්ක ලබා නොදීම හා විධිමත් පසු විපරම් ක්‍රමවේදයක් නොමැති වීම.
4. නිළධාරීන් උත්පේරණය උදෙසා ඇගයුම් ක්‍රමවේදයක් නොමැති වීම.
5. රජයේ ඉඩම් මගින් අයකරගත හැකි ඉඩම් ආදායම් උපරිම අයුරින් අයකර ගැනීමේ ක්‍රමවේදයක් නොමැති වීම.
6. ප්‍රධාන කාර්යාලය සඳහා දෙපාර්තමේන්තුව සතු ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත කාර්යාල පරිශ්‍රයක් නොමැති වීම.
7. ඉඩම් කළමණාකරණය සඳහා භෞතික හා මූල්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම.

**<u>අවස්ථා( O)</u>**

1. රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ දී ඉඩම් විෂය සඳහා ප්‍රමුඛත්වයක් ලබා දීම නිසා ඉඩම් කළමණාකරණය උදෙසා ක්‍රියාත්මක කරවනු ලබන ව්‍යාපෘති සඳහා මධ්‍යම රජයේ දායකත්වය ලබාදීම.
2. ඉඩම් රාජකාරී සඳහා මහජනතාවගේ උනන්දුව සහ පිළිගැනීම.
3. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට ආයතන මට්ටමින් ලැබෙන සහාය.
4. අනෙකුත් ආයතන වලින් ලැබෙන පුහුණු අවස්ථා.
5. සමාන්තර ආයතන වලින් ලැබෙන සහාය (උදා- මිනින්දෝරු දෙපාර්තමේන්තුව)
6. ජාතික ආර්ථිකය  නංවාලීම සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දායක වීමට හැකි වීම.
7. ඉඩම් කළමණාකරණය උදෙසා වන පළාත් මට්ටම හා සෘජුව සම්බන්ධවන මධ්‍යම රජයේ ආයතන පැවතීම.

**<u>තර්ජන  (T)</u>**

1. රජයේ ඉඩම් සම්පත්  සීමිත වීම.
2. වර්තමාන සමාජයට ගැලපෙන ලෙස පවත්නා නීති පද්ධතිය කඩිනමින් වෙනස් කර ගත නොහැකි වීම.
3. රජයේ ඉඩම් නීති පිළිබඳ මහජනතාවගේ නොදැනුවත්කම.
4. ඉඩම් බැහැර කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ගතවන කාලය දීර්ඝ වීම.
5. ඉඩම් රාජකාරී වලට අනවශ්‍ය දේශපාලන මැදිහත්වීම.
6. ඉඩම් බැහැර කිරීමේ දී  ඉඩම් අවභාවිතය තුළින් රාජ්‍ය ආදායම අහිමි වීම.
7. වරින්වර ගනු ලබන දේශපාලන තීන්දු මත රජයේ ඉඩම් කළමණාකරණ ව්‍යාකූලතා පැන නැඟීම.

# පරිච්ඡේදය 07

# ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙල.

දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගනිමින් දකුණු පළාතේ මහජනතාව සඳහා කාර්යක්ෂම හා ඵලදායී සේවයක් සැපයීමේ අරමුණින් 2020 – 2024 කාල පරිච්ඡේදය සඳහා දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඉදිරි පස් අවුරුදු දැක්ම මෙම උපාය මාර්ගික සැලැස්මෙන් විදහාපානු ලබයි. මෙහිදී ප්‍රමුඛත්වය ලබාදී ඇති දෙපාර්තමේන්තු කාර්යයන්, පරමාර්ථ හා අරමුණු නිශ්චය කිරීමේදී සහස්‍ර සංවර්ධන ඉලක්කයන් මත සමපාත වී එම ඉලක්කයන් තුලින් අප දෙපාර්තමේන්තුවට ජයගත හැකි ඉලක්කයන් හඳුනා ගනිමින් ඊට අනුගතව හා සමානුපාතිකව දෙපාර්තමේන්තු ඉදිරි පරමාර්ථයන් හා අරමුණු නිශ්චය කොට ඇත.

ඉඩම් රාජකාරි ඉටුකිරීමේදී දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව ඉඩම් රාජකාරි ඉටුකිරීමේ අවසාන බලධරයා නොවන අතර ප්‍රාදේශීය මට්ටමින් ප්‍රාදේශීය ලේකම් හා ජාතික මට්ටමින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව අතර රාජකාරීමය සම්බන්ධීකරණය මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබයි. අප දෙපාර්තමේන්තුව මඟින් ගාල්ල, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුන කේන්ද්‍ර කර ගනිමින් සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල තුනක් ස්ථාපිත කර ඇති අතර දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 47 සඳහාම ජනපද නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් අප දෙපාර්තමේන්තුව මඟින් අනුයුක්ත කර ඇත. එම නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දෙපාර්තමේන්තු පරමාර්ථ සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාල තාක්ෂණික සේවාව සැපයීම හා සම්බන්ධීකරණය සිදුකරනු ලබයි.

2020 – 2024 උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉටු කිරීමට ඇති ඉඩම් රාජකාරි ඉටුකිරීම පිළිබඳ මූලික තොරතුරු රැස්කර එය සමාලෝචනයට ලක් කරනු ලැබීය. ඊට අමතරව නවීන තාක්ෂණය තොරතුරු තාක්ෂණය උපරිම අයුරින් යොදා ගනිමින් නවීන ලෝකයාට ගැලපෙන පරිදි විවිධ උපාය මාර්ගයන් අනුගමනය කරමින් ඉදිරි වසර 05 තුළ නිශ්චිත හා ඉලක්කගත වැඩපිළිවෙලක් මඟින් ඉදිරි අභියෝග ජය ගැනීමට සැලසුම් කර ඇත.

2020 වර්ෂයේ ජනවාරි මාසය තුළ දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් හට උපාය මාර්ගික සැලැස්මට අනුව ඉදිරි පස් වසර තුළ ළඟා කරගත යුතු ඉලක්ක හා කාර්යභාරය ඉලක්කයක් ලෙස ලබාදෙනු ඇත. එම ඉලක්කයන් ළඟාකර ගැනීම පිලිබඳ සෑම මාස දෙකකට වරක්ම දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කරන අතර එහිදි එම නිලධාරීන් හට සිය රාජකාරි ඉටුකිරීමේදී මතුවෙන ගැටළු සමනය කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව වශයෙන් අවශ්‍ය මැදිහත්වීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ඇත. ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් රාජකාරි ඉටුකිරීමේ බලධරයා වනුයේ ප්‍රාදේශීය ලේකම් වන අතර ඔහු සෘජුවම සම්බන්ධීකරණය කිරීමේ පවතින නෛතික ගැටළුව හේතුවෙන් වර්ෂයකට තුන් වතාවක් දිස්ත්‍රික් ලේකම්වරයාගේ මූලිකත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සමභාගීත්වයෙන් පවත්වනු ලබයි. මෙහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කිරීම හා පවත්නා ගැටළු හඳුනාගනු ලබයි.

2020 – 2024 කාල පරිච්ඡේදයට අදාලව දෙපාර්තමේන්තුවේ වියදම් සැලසුම් කිරීමේදී මෙම උපාය මාර්ගික සැලැස්ම මත පමණක්ම වියදම් සැලසුම් කරන බැවින් රාජ්‍ය මූල්‍ය කළමණාකරණය විධිමත්ව සිදුකිරිමත් විගණන විමසුම් අවම කර ගැනීමත් අපේක්ෂා කරනු ලබන අතර දකුණු පළාතේ ජනතාවගේ ආර්ථික හා සමාජීය තත්ත්වය ඉහළ නැංවීම සඳහා අප දෙපාර්තමේන්තුවට ලබාදිය හැකි උපරිම දායකත්වය ලබාදීමට අපේක්ෂා කරයි. ඒ සඳහා පහත ක්‍රියාමාර්ගයන් අනුගමනය කරනු ලබයි.

1. 2020 ජනවාරි මාසයේ දකුණු පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික සැලැස්ම පිළිබඳව හා සෑම වර්ෂයකම ජනවාරි මාසයේ උපාය මාර්ගික සැලැස්මට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්/ඉඩම් නිලධාරීන් /ජනපද නිළධාරීන් /සංවර්ධන නිළධාරීන් සහ දෙපාර්තමේන්තුවේ සේවය කරන අනෙකුත් සියළුම නිළධාරීන් දැනුවත් කිරීම.
2. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ළඟාකරගත හැකි පරිදි දෙපාර්තමේන්තුවේ සියළුම නිළධාරීන් සඳහා වාර්ෂික ඉලක්ක ලබාදීම.
3. දිස්ත්‍රික් මට්ටමින් පවතින සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වලට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ලබාදීම හා දිස්ත්‍රික්කය තුළ නිලධාරීන් මෙහෙයවමින් ඉලක්ක ළඟාකර ගැනීමට උනන්දු කරවීම.
4. බාහිර වශයෙන් නිලධාරීන් හට එල්ලවන තර්ජන අවම කර ගැනීම සඳහා දකුණු පළාතේ ඉඩම් අමාත්‍යවරයා සහ අමාත්‍යාංශයේ නිලධාරින්ගේ මැදිහත්වීම උපරිම අයුරින් ලබා ගැනීම.
5. පාලනය කළ නොහැකි බාහිර හා පාරිසරික සාධකයන් ජය ගැනීම සඳහා නිලධාරීන් උනන්දු කරවීම හා දැනුවත් කිරීම.
6. විධිමත් පුහුණු සැලැස්මකට අනුව දෙපාර්තමේන්තු මාණ්ඩලික නිළධාරීන්,ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්,ඉඩම් නිළධාරීන්,ජනපද නිළධාරීන්,සංවර්ධන නිළධාරීන්,කළමණාකරණ සහකාර සේවයේ නිළධාරීන් ,ග්‍රාම නිළධාරීන් ,මැනුම් සහායකවරුන් සහ අනෙකුත් අදාළ නිලධාරීන් පුහුණු කරවීම.
7. අනුමත සේවක සංඛ්‍යාව පවත්වා ගැනීමට ප්‍රශස්ථ මානව සම්පත් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට (HR-PLAN) කටයුතු කිරීම.
8. ප්‍රසස්ථ අයුරින් ලබා දි ඇති ඉලක්ක වාර්ෂිකව සපුරාගනු ලබන නිලධාරීන් ඇගයීම සඳහා වාර්ෂිකව වැඩසටහනක් සංවිධානය කිරීම.
9. ඉඩම් රාජකාරි ඉටු කිරීම සඳහා මූලිකව ඉහළ දායකත්වයක් ලබාදෙන ග්‍රාම නිළධාරීන් අතරින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් ඉහළම දායකත්වය ලබා දී ඇති ග්‍රාම නිළධාරී තේරීම සහ එසේ තෝරාගනු ලබන පළාතේ හොඳම ග්‍රාම නිළධාරීන් 47 දෙනා සඳහා බැහැර ගත නේවාසික පුහුණු වැඩමුළුවක් සෑම වර්ෂයකම සංවිධානය කිරීම.

10. දකුණු පළාත තුළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 47 කලාප 06 කට බෙදා වෙන් කර එක් එක් කලාපයක් භාරව ජෝශ්‍ය ජනපද නිලධාරීන් එක් කිරීම.
11. උපාය මාර්ගික සැල්ස්මට අනුව වාර්ෂික ඉලක්ක සැකසීම හා අදාල නිලධාරීන් සම්බන්ධීකරණය කර ඉලක්ක ළඟාකර ගැනීමේ වගකීම පැවරීම.

ඉඩම් රාජකාරි ඉටුකිරීමේදී එම කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා වෙනත් බාහිර ආයතන හා දෙපාර්තමේන්තු ගණනාවක සහාය හා නිර්දේශයන් ලබා ගැනීමට සිදුවනු ඇත. මෙම නිර්දේශ එක් එක් ආයතන මගින් වෙන් වෙන් වශයෙන් ලබා ගැනිමේදී විශාල කාලයක් ගතවන බව අතිත අත්දැකීමයි. මෙය මඟහරවා ගනිමින් එම දෙපාර්තමේන්තු සියල්ල එක් ස්ථානයකට කැඳවා අවශ්‍ය නිර්දේශ ලබාගැනීම සඳහා අවශ්‍ය ඒකාබද්ධ කමිටු රැස්වීම් පැවැත්වීමට සැලසුම් කර ඇත.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය, සේවක අභිප්‍රේරණ ප්‍රවර්ධන අවශ්‍යතා හඳුනා ගනිමින් එම අවශ්‍යතාවයන්ට සරිලන පුහුණුවීම් ලබා දෙමින් එම නිලධාරීන්ගේ උපරිම දායකත්වය ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. වාර්ෂිකව නිලධාරීන් විසින් ළඟා කරගනු ලබන ඉලක්කයන් සමාලෝචනයට ලක් කරමින් එක් එක් නිලධාරී කාණ්ඩයන් වෙන් වෙන් වශයෙන් ඇගයීමකට ලක් කර විශිෂ්ඨ අයුරින් ඉලක්ක ළඟා කරගත් නිලධාරීන් සඳහා තිළිණ සහ ප්‍රශංසා සහතික නිකුත් කිරීම වර්ෂාවසානයේදි සිදුකරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන්ගේ කාර්යය සාධන ඇගයීම් වැඩපිළිවල වඩාත් විද්‍යාත්මක හා යථාර්තවාදි වන අයුරින් සිදු කිරිම සඳහා වර්ෂය ආරම්භයේ සෑම නිළධාරියෙක් සඳහාම වාර්ෂික ඉලක්ක ලබාදෙනු ඇත. එසේ එක් එක් දිස්ත්‍රික්කය භාර සහකාර ඉඩම් කොමසාරිස්වරු විසින් වාර්ෂික ඉලක්ක සපුරාලන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සමග කාර්යය සාධන ගිවිසුමකට එළඹෙන අතර සහකාර ඉඩම් කොමසාරිස්වරු විසින් අනෙකුත් නිලධාරින් සමග එම නිළධාරීන්ගේ වාර්ෂික ඉලක්ක සාක්ෂාත් කර දෙන බවට ගිවිසුම්ගත කිරීමට අපේක්ෂිතය.

එමෙන්ම දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතලිස් හත සඳහා අනුයුක්ත කර ඇති ඉඩම් නිලධාරින්,ජනපද නිළධාරීන් සහ සංවර්ධන නිළධාරීන්ගේ  වාර්ෂිකව ඉටුකරන ලද රාජකාරි පිළිබඳ සමාලෝචන වාර්තාවක්ද ලබා ගැනීමට කටයුතු කරනු ලබයි.එම සියළු කරුනු සැලකිල්ලට ගෙන නිළධාරීන්ගේ කාර්යය සාධනය සමාලෝචනය කරනු ලබන අතර වාර්ෂික වැටුප් වර්ධකය ලබා දෙනුයේ ද එහි ප්‍රගතිය සැලකිල්ලට ගෙනයි.

# පරිච්ඡේදය 08
# පසු විපරම් කිරීම, ඇගයීම හා පාලනය.

**අධීක්ෂණය සහ පසු විපරම:- උපාය මාර්ගික සැලැස්ම නිසියාකාරව ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව අධීක්ෂණය සහ පසු විපරම සිදුකරන ආකාරය පිළිබඳ යෝජනා**

1. කලාප භාර ඉඩම් නිලධාරීන් විසින් ළඟාකර ගත් ප්‍රගතිය පිළිබඳ මාසික ප්‍රගතිය සහකාර ඉඩම් කොමසාරිස් වෙත වාර්තා කිරීම.
2. සහකාර ඉඩම් කොමසාරිස් විසින් ළඟාකර ගත් ප්‍රගතිය මාස තුනකට වරක් පැවැත්වෙන මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීමේදී පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීම හා සමාලෝචනය කිරීම.
3. මාණ්ඩලික නිලධාරි රැස්වීමේදී ගනු ලබන තීරණ මත මාස දෙකකට වරක් දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම පැවැත්වීම.
4. වර්ෂයේ ජනවාරි මාසයේ වාර්ෂික ඉලක්ක ලබා දීමේ සහ දෙසැම්බර් මාසයේ පළාත් ප්‍රගතිය සමාලෝචනය කිරීමේ රැස්වීම පැවැත්වීම.
5. ත්‍රෛමාසික සභරාව මඟින් ඉහළ කාර්ය සාධනයක් ලබාගත් නිලධාරීන් අභිප්‍රේරණය කිරීමට කටයුතු කිරීම.
6. වාර්ෂික වර්ණ ප්‍රදානෝත්සවය තුලින් නිලධාරීන් හා මාණ්ඩලික නිලධාරීන් සඳහා ඇගයීම් හා පෙළඹවීම් ඇති කිරීම.
7. දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මාස තුනකට වරක් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් හා ඉඩම් රාජකාරි සඳහා දායකවන අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතන ප්‍රධානීන් ද සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
8. අභ්‍යන්තර විගණන කමිටුව මගින් මාස තුනකට වරක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය විගණනය කිරීම සහ එහි ප්‍රගතිය මාණ්ඩලික නිළධාරී සාකච්ජාවට යොමු කළ යුතුය.

# පරිච්ඡේදය 09

# විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම

| විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **අභිමතාර්ථ** | **අරමුණ** | **දර්ශකය** | **වර්තමාන යේ සාධන තත්වය (2019)** | **2020** | **(2020-2024)** | **උපාය මාර්ගයන්0** | **ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලැස්ම** | **සම්බණ්ධීකරණ වගකීම54** | **අපේක්ෂිත ප්‍රතිලාභය** | **සහශ්‍ර සංවර්ධන ඉලක්ක කේතය** | **ජාතික ප්‍රතිපත්තිය** | **ඇස්තමේන්තු ගත පිරිවැය.** |
| සීමිත සම්පතක් ලෙස රජයේ ඉඩම් වල විධිමත් කළමනාකරණය තහවුරු කිරීම. | 01.බෙදාදීමට යෝජිත ඉඩම් කොටස් වලට අදාල අනුරේඛන සකස් කිරීම. | අනුරේඛන ප්‍රමාණය | 00 | 750 | 2500 | 01.ආයතනය සතු භෞතික හා මානව සම්පත් යොදා ගැනීම<br><br>02. මැනුම් කටයුතු මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සිදුකරවා ගැනීම. | 01. බෙදා දීමට යෝජිත ඉඩම් කැබලි පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගැනීම.<br>02. මැනුම් කිරීමට ඇති ඉඩම් පිළිබඳ සාරාංශ වාර්තා සකස් කිරීම හා ප්‍රාදේශීය ලේකම් මඟින් මැනුම් ඉල්ලීම් යොමු කරවා ගැනීම. | සහකාර ඉඩම් කොමසාරිස්/ දෙපාර්තමේන්තු මිනින්දෝරු/ මූලස්ථාන ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී/ සංවර්ධන නිලධාරි/ කළමනාකරණ සහකාර. | නිරවුල් ඉඩමක අයිතිය මහජනතාවට ලැබීමෙන් ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය ඉහළ යාම තුළින් දකුණු පළාතේ සංවර්ධනය ඉහළ යාම. | 1.4. | භෞතික සම්පත් සංවර්ධනය | 00.00<br><br>සෘජු පිරිවැයක් නොමැත වාර්ෂික පුනරාවර්ථන ඇස්තමේන්තුව යටතේ නිළධාරීන් සඳහා වැයවන වැටුප්,ගමන් වියදම් හා ඉන්දන සඳහා දරණ වියදම් තුළින් මීට අදාළ වියදම් ආවරණය වේ. |
| | 02.බෙදා දීමට යෝජිත ඉඩම් කොටස් වල පොදු කටයුතු සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම. | පොදු කටයුතු සඳහා හඳුනාගනු ලබන ඉඩම් ප්‍රමාණය. | 00 | 15 | 50 | 01.ආයතන සතු භෞතික හා මානව සම්පත් යොදා ගැනීම | 01. බෙදා දීමට යෝජිත ඉඩම් කොටස් වල පොදු කටයුතු සඳහා සුදුසු ඉඩම් පිළිබඳ යෝජනා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගැනීම.<br><br>02. හඳුනාගනු ලබන ඉඩම් මැනුම් කරවා ගැනීම. | සහකාර ඉඩම් කොමසාරිස්/ මූලස්ථාන ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී/ සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සහකාර | පොදු අවශ්‍යතා සඳහා ඉඩම් ලබාදීම තුළින් ජනතාවගේ අවශ්‍යතා ඉටුවීම හරහා පළාතේ සමාජීය තත්ත්වය ඉහළ යාම | | | |

| අභිමතාර්ථ | අරමුණ | දර්ශකය | වර්තමාන යේ සාධන තත්වය (2019) | ඉටුකර ගැනීමට සැලසුම් කර ඇති ඉලක්කයන් | | උපාය මාර්ගයන් | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලැස්ම | සම්බණ්ධීකරණ වගකීම | අපේක්ෂිත ප්‍රතිලාභය | සහශ්‍ර සංවර්ධන ඉලක්ක කේතය | ජාතික ප්‍රතිපත්තිය. | ඇස්තමේන්තු ගත පිරිවැය. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2020 | (2020-2024) | | | | | | | |
| සීමිත සම්පතක් ලෙස රජයේ ඉඩම් වල විධිමත් කළමණාකරණය තහවුරු කිරීම. | 03.බෙදා දීමට යෝජිත ඉඩම් කොටස් අතර ඉදිරි අවශ්‍යතා සඳහා රක්ෂිත ඉඩම් කොටස් හඳුනා ගැනීම. | හඳුනාගනු ලබන රක්ෂිත ඉඩම් කොටස් ගණන. | 03 | 08 | 25 | ආයතන සතු භෞතික හා මානව සම්පත් යොදා ගැනීම. | 01. බෙදා දීමට යෝජිත ඉඩම් කොටස් අතරින් සංරක්ෂණය කිරීමට සුදුසු ඉඩම් පිළිබඳ යෝජනා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබා ගැනීම.<br><br>02. හඳුනාගනු ලබන ඉඩම් මැනුම් කරවා ගැනීම. | සහකාර ඉඩම් කොමසාරිස් / මූලස්ථාන ඉඩම් නිලධාරී/ ජනපද නිලධාරී/ සංවර්ධන නිලධාරි/ කළමනාකරණ සහකාර. | අනාගත අවශ්‍යතා සඳහා ඉඩම් සංරක්ෂණය කිරීම තුළින් අනාගත ජනතාවගේ ඉඩම් අවශ්‍යතා ඉටුවීම තුලින් තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගත හැකි වීම. | 1.4 | භෞතික සම්පත් සංවර්ධනය | 00.00 සෘජු පිරිවැයක් නොමැත වාර්ෂික පුනරාවර්ථන ඇස්තමේන්තුව යටතේ නිළධාරීන් සඳහා වැයවන වැටුප්,ගමන් වියදම් හා ඉන්දන සඳහා දරණ වියදම් තුළින් මීට අදාළ වියදම් ආවරණය වේ. |

| අභිමතාර්ථ | අරමුණ | දර්ශකය | වර්තමාන යේ සාධන තත්වය (2019) | ඉටුකර ගැනීමට සැලසුම් කර ඇති ඉලක්කයන් | | උපාය මාර්ගයන් | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලැස්ම | සම්බණ්ධීකරණ වගකීම | අපේක්ෂිත ප්‍රතිලාභය | සහශ්‍ර සංවර්ධන ඉලක්ක කේතය | ජාතික ප්‍රතිපත්තිය | ඇස්තමේන්තු ගත පිරිවැය. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2020 | (2020-2024) | | | | | | | |
| ඉඩම් නොමැති ජනතාව සඳහා නිරවුල් බිමක උරුමය ලබාදීම. | 04.බලපත්‍ර නොමැති පුද්ගලයන් සඳහා ස්ථිර බලපත්‍ර නිකුත් කිරීම. | නිකුත් කරනු ලබන බලපත්‍ර සංඛ්‍යාව | 2659 | 3000 | 10000 | 01. ආයතනය සතු මානව හා භෞතික සම්පත් පූර්ණ උපයෝජනය ට ලක් කිරීම.<br><br>02.කණ්ඩායම් ප්‍රවේශයන් තුළින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම. | 01.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් නිලධාරීන්/ජනපද නිලධාරීන් සඳහා ඉලක්ක ලබාදීම.<br>02. මාස දෙකකට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම මඟින් ප්‍රගතිය සමාලෝචනය කිරීම.<br><br>03.විශිෂ්ඨ මට්ටමින් ඉලක්ක සපුරන ලද නිලධාරීන් වාර්ෂිකව ඇගයීම. | සහකාර ඉඩම් කොමසාරිස්/ ගණකාධිකාරී/ මූලස්ථාන ඉඩම් නිලධාරී/ ඉඩම් නිලධාරී/ජනපද නිළධාරී/ සංවර්ධන නිළධාරී(විෂය)/ කළමනාකරණ සහකාර(විෂය) | නිරවුල් බිමක හිමිකම ලැබීම තුලින් ඉඩම් ලාභීන්ගේ ආර්ථික හා සාමාජීය තත්ත්වය ඉහළ යාම තුලින් පළාතේ සංවර්ධනය සඳහා දායක වීම. | 10.2 | භෞතික සම්පත් සංවර්ධනය | 00.00<br>ඍජු පිරිවැයක් නොමැත වාර්ෂික පුනරාවර්ථන ඇස්තමේන්තු ව යටතේ නිළධාරීන් සඳහා වැයවන වැටුප්,ගමන් වියදම් හා ඉන්දන සඳහා දරණ වියදම් තුළින් මීට අදාළ වියදම් ආවරණය වේ. |

| අභිමතාර්ථ | අරමුණ | දර්ශකය | වර්තමාන යේ සාධන තත්වය (2019) | ඉටුකර ගැනීමට සැලසුම් කර ඇති ඉලක්කයන් | | උපාය මාර්ගයන් | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලැස්ම | සම්බණ්ධීකරණ වගකීම | අපේක්ෂිත ප්‍රතිලාභය | සහශ්‍ර සංවර්ධන ඉලක්ක කේතය | ජාතික ප්‍රතිපත්තිය | ඇස්තමේන්තු ගත පිරිවැය. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2020 | (2020-2024) | | | | | | | |
| ඉඩම් නොමැති ජනතාව සඳහා නිරවුල් බිමක උරුමය ලබාදීම. | 05.නව දීමනා පත්‍ර සැකසීමට අදාළව නිර්දේශ ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීම. | නිර්දේශ වාර්තා සංඛ්‍යාව. | 1680 | 2000 | 5000 | ආයතන සතු භෞතික හා මානව සම්පත් යොදා ගැනීම. | 01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ජනපද නිලධාරීන් සඳහා ඉලක්ක ලබාදීම.<br>02. මාස දෙකකට වරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම මඟින් ප්‍රගතිය සමාලෝචනය කිරීම.<br>03.විශිෂ්ඨ මට්ටමින් ඉලක්ක සපුරන ලද නිලධාරීන් වාර්ෂිකව ඇගයීම. | සහකාර ඉඩම් කොමසාරිස්/ ගණකාධිකාරී/ මූලස්ථාන ඉඩම් නිලධාරී/ සංවර්ධන නිලධාරී/ කළමණාකරණ සහකාර. | නිරවුල් බිමක හිමිකම ලැබීම තුලින් ඉඩම් ලාභීන්ගේ ආර්ථික හා සාමාජීය තත්ත්වය ඉහළ යාම තුලින් පළාතේ සංවර්ධනය සඳහා දායක වීම. | 10.2. | භෞතික සම්පත් සංවර්ධනය | 00.00<br>සෘජු පිරිවැයක් නොමැත වාර්ෂික පුනරාවර්ථන ඇස්තමේන්තුව යටතේ නිළධාරීන් සඳහා වැයවන වැටුප්,ගමන් වියදම් හා ඉන්දන සඳහා දරණ වියදම් තුළින් මීට අදාළ වියදම් ආවරණය වේ. |

| අභිමතාර්ථ | අරමුණ | දර්ශකය | වර්තමාන යේ සාධන තත්වය (2019) | ඉටුකර ගැනීමට සැලසුම් කර ඇති ඉලක්කයන් | | උපාය මාර්ගයන් | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලැස්ම | සම්බණ්ධීකරණ වගකීම | අපේක්ෂිත ප්‍රතිලාභය | සහශ්‍ර සංවර්ධන ඉලක්ක කේතය | ජාතික ප්‍රතිපත්තිය | ඇස්තමේන්තු ගත පිරිවැය. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2020 | (2020-2024) | | | | | | | |
| ඉඩම් නොමැති ජනතාව සඳහා නිරවුල් බිමක උරුමය ලබාදීම. | 06.නිදහස් දීමනා පත්‍ර සැකසීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම. | නිර්දේශ ඉදිරිපත් කරනු ලබන වාර්තා සංඛ්‍යාව. | 34 | 150 | 5000 | ආයතනය සතු මානව හා භෞතික සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කිරීම. | 01.ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් නිලධාරීන්/ජනපද නිලධාරීන් සඳහා ඉලක්ක ලබාදීම.<br><br>02. කාර්තුවකට වරක් දිසාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡා වට පැවැත්වීම. | සහකාර ඉඩම් කොමසාරිස් / මූලස්ථාන ඉඩම් නිලධාරී/ඉඩම් නිළධාරී/ සංවර්ධන නිළධාරී/ කළමණාකරණ සහකාර. | ඉඩම් හිමියන්ගේ ඉඩමේ පරම අයිතිය සුරක්ෂිත කිරීම මඟින් ඔවුන්ගේ සාමාජීය මට්ටම ඉහළ නැංවීම. | 10.2. | භෞතික සම්පත් සංවර්ධනය | 00.00<br><br>ඍජු පිරිවැයක් නොමැත වාර්ෂික පුනරාවර්ථන ඇස්තමේන්තුව යටතේ නිළධාරීන් සඳහා වැයවන වැටුප්,ගමන් වියදම් හා ඉන්දන සඳහා දරණ වියදම් තුළින් මීට අදාළ වියදම් ආවරණය වේ. |

| අභිමතාර්ථ | අරමුණ | දර්ශකය | වර්තමාන යේ සාධන තත්වය (2019) | ඉටුකර ගැනීමට සැලසුම් කර ඇති ඉලක්කයන් | | උපාය මාර්ගයන් | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලැස්ම | සම්බන්ධීකරණ වගකීම | අපේක්ෂිත ප්‍රතිලාභය | සහශ්‍ර සංවර්ධන ඉලක්ක කේතය | ජාතික ප්‍රතිපත්තිය | ඇස්තමේන්තු ගත පිරිවැය. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2020 | (2020-2024) | | | | | | | |
